# වැවිලි කර්මාන්ත අමාත්‍ය නවින් දිසානායක මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් අනුරාධපුරයට පොල් විජලන කම්හලක්.

වැවිලි කර්මාන්ත අමාත්‍ය නවින් දිසානායක මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ඔස්ට්‍රේලියාවේ සන්මික් ෆුඩ් සමූහ ව්‍යාපාරය සහ ශ්‍රී ලංකාවේ සන්මික් ෆුඩ් සමූහ ව්‍යාපාරය ඒකාබද්ධව රුපියල් මිලියන 700ක මුදලක් ආයෝජනය කරමින් ස්ථාපනය කරන ලද දිසිදි පොල් කර්මාන්ත ශාලාව හා පොල් විජලනය ඒකකයක් ( **Sanmik Food (Pvt) Ltd. DC Factory & Dehydration Unit** ) 2019 ජනවාරි මස 19 වන දා අනුරාධපුරයේ ඉපලෝගමදී විවෘත කරන ලදී.

දිසිදි පොල් කොළ විජලනය ඒකකයට අමතරව, කර්මාන්ත ශාලාව අපනයන කාර්යයන් සඳහා මුරුංගා විජලනය කිරීමට විශේෂ ඒකකයක් ද මෙහි ස්ථාපනය කර ඇත. ඉදිරි අදියරයන් හිදී සමාගම විසින් ලෝක වෙළඳපොළ සඳහා විජලනය කළ මුරුංගා වලින් සෞඛ්‍යයට හිතකර ඖෂධ නිෂ්පාදනය කර අපනයන කිරීම සඳහා කටයුතු කිරීමට ද අපේක්ෂා කරයි.

මෙහිදී දේශීය දිසිදි පොල් කර්මාන්ත ක්ෂේත්‍රයේ පෙරළියක් ඇති කරමින් දිසිදි පොල් කර්මාන්ත ක්ෂේත්‍රයට නව තාක්ෂණය යෙදවීම තුළින් දිසිදි පොල් කර්මාන්ත අංශය දියුණු කිරීම මෙන්ම ප්‍රදේශවාසීන්ට මේ තුළින් සෘජු රැකියා අවස්ථා 150ක් සහ වක්‍ර රැකියා අවස්ථා 400 පමණ ලබා දීමට බලාපොරොත්තු වේ. එසේම දිස්ත්‍රික්කය පුරා පොල් වගාවට නව නැඹුරුවක් ඇති කිරීම, උතුරුමැද පළාතේ පොල් ගොවීන් සඳහා ස්ථාවර මිලක් ලබාදීම , අතුරු නිෂ්පාදන රසකට පිවිසීමට අවස්ථාව ඇති කිරීම, ප්‍රදේශයේ යටිතල පහසුකම් දියුණු කිරීම ආදිය තුළින් ග්‍රාමීය ආර්ථිකය ශක්තිමත් කිරීම කර්මාන්ත ශාලාව තුළින් අපේක්ෂිත අරමුණු වන බව එම අවස්ථාවේදී අමාත්‍ය නවින් දිසානායක මහතා පැවසීය.